Article 11

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2019 - 11 - 07

පැමිණිලිකරු : එස්.ඩබ්ලිව්. ඉදුනිල් චාමර සිල්වා මහතා,
අංක. 14, යාය 08,
දේවගල.

වගඋත්තරකරුවන් : 01. උප පොලිස් පරීක්ෂක කාරියවසම් මහතා,
පොලිස් ස්ථානය,
වැලිකන්ද.

02. පොලිස් කොස්තාපල් 46036 සුමිත් මහතා,
මූලස්ථාන පොලිස් ස්ථානය,
පොළොන්නරුව.

පැමිණිලි අංකය : **HRC/AP/258/2016**

පැමිණිල්ල :-

ඉහත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, 2016.04.08 වන දින උදේ 8.15ට පමණ වී වේලමින් සිටියදී සිවිල් ඇඳුමින් සැරසුණු පොලිස් නිලධාරීන් 07 දෙනෙකු තම ස්ථානයට ඇතුළු වී තමන්ව පොළොන්නරුව මූලස්ථාන පොලීසිය වෙත රැගෙන ගිය බවයි.

පොලීසියට රැගෙන ගොස් අපරාධ අංශයේ ස්ථානාධිපති වන කාරියවසම් මහතා විසින් අපරාධ අංශය තුළදී තමාට පහරක් ගසන ලද බවත්, අනතුරුව පොලිස් ස්ථානයේ පුටුවක වාඩිකර තබා සවස 4.30ට පමණ සිර මැදිරියට දමන ලද බවත් සඳහන් කර ඇත.

රාත්‍රී 9.30ට පමණ සිර මැදිරියෙන් එළියට ගෙන අපරාධ අංශයේ කාමරයකට රැගෙන ගොස් විද්‍යා පීඨයේ මනූෂ අබේසිංහ යන අයට අයත් ගස් කපන යන්ත්‍රයක් සොරකම් කරන ලද බවට චෝදනාව භාර ගන්නා ලෙසට වගඋත්තරකරුවන් පවසන ලද බවත්, එසේ භාර නොගන්නේ නම් ඇඳුම් ගලවා මාංචු දමන ලද බව පැවසූ



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrc@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11- 2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

බවත්, වැරැද්ද භාර නොගත් බැවින් පිට හරහා මාංචු දමා හෝස් බටයකින් පහර දුන් බවත් සඳහන් කර ඇත. එම අවස්ථාවේදි මත්පැන් පානය කර සිටි කාරියවසම් මහතා තමාට පහරදුන් බවත් මෙලෙස 2016.04.08 රාත්‍රියේ සිට පසුදා අලුයම 4.30 තෙක් තමන්ට පහරදුන් බවත් සඳහන් කර ඇත.

පසුව අත් මාංචු ගලවා අත්දෙකට ව්‍යායාම සිදුකර ඇඳුම් අන්දවන ලද බවත්, පසුව තමන්ව ගරු අධිකරණය වෙත ඉදිරිපත් කළ බවත් සඳහන් කර ඇති අතර, වගඋත්තරකරුවන්ගේ මෙකී ක්‍රියා කලාපය හේතුවෙන් තම මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවද සඳහන් කර ඇත.

වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම :-

මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් මූලස්ථාන ප්‍රධාන පොලිස් පරීක්ෂක,පොළොන්නරුව වෙතින් වාර්තාවක් කැඳවා ඇති අතර, එම වාර්තාව මඟින් මූලස්ථාන ප්‍රධාන පොලිස් පරීක්ෂකවරයා ප්‍රකාශ කර ඇත්තේ, පොළොන්නරු විද්‍යා පීඨයේ ක්‍රීඩාගාර කාමරය බිඳ භාණ්ඩ සොරකම් කිරීමක් සම්බන්ධයෙන් වන පැමිණිල්ලක් පොලීසිය වෙත ලද බවත්, මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් විමර්ශනයක් සිදු කරන ලද බවත්, මෙම විමර්ශනයේදී ඇඟිලි සටහන ලබා ගෙන ඇති බවත්ය. එසේ ලබා ගත් ඇඟිලි සටහන් අනුව වැඩිදුර විමර්ශන සිදු කරන බවත් එහිදි විද්‍යා පීඨයේ සේවය කළ 12 දෙනෙකුගේ ඇඟිලි සටහන් රෙජිස්ට්‍රාර් වෙත යොමු කරන ලද බවත්, ඒ අනුව විද්‍යා පීඨයේ මුරකරුවෙකු ලෙස සේවය කරන ඉදුනිල් චාමර සිල්වා යන අයගේ ඇඟිලි සටහන් සමඟ අදාළ ඇඟිලි සලකුණු සැසඳෙන බවට වාර්තාව ලද බවත්, ඒ අනුව උප පොලිස් පරීක්ෂක කාරියවසම් ඇතුළු නිලධාරින් විසින් මෙම පැමිණිලිකරුව 2016.04.06 වන දින පැය 23.00 ට අත්අඩංගුවට ගත් බවත්, 2016.04.09 දින ගරු අධිකරණය වෙත ඉදිරිපත්කළ බවත් සඳහන් කර ඇත.

වගඋත්තරකරුවන් ප්‍රකාශ කර සිටින්නේ, පොළොන්නරුව මූලස්ථාන පොලීසිය වෙත ලද පැමිණිල්ලකට අනුව විමර්ශනයක් සිදුකර විමර්ශනයේදි අනාවරණය කර ගන්නා ලද තොරතුරු මත මෙම පැමිණිලිකරුව අත්අඩංගුවට ගත් බවත්, එමෙන්ම පැමිණිලිකරු විසින් වගඋත්තරකරුවන්ට එරෙහිව කරනු ලබන පහරදීමේ චෝදනා ප්‍රතික්ෂේප කරනු ලබන බවත් සඳහන් කර ඇත.

මානව හිමිකම් කොමිෂන් සභාවේ විමර්ශනය :-

පැමිණිල්ල මඟින් දක්වනුයේ නීතියේ නියම කරන කාර්යය පටිපාටියට අදාළව අත්අඩංගුවට නොගැනීම හා වධහිංසාවට ලක් කිරීම පිළිබඳවත් ඒ අනුව නීතියේ නියම කරන ලද කාර්ය පටිපාටියට අදාළව අත්අඩංගුවට ගත්තාද යන්න සැළකීමේදී,

2016.02.23 දින ජාතික අධ්‍යාපන විද්‍යා පීඨයේ ක්‍රීඩාගාර කාමරයක් බිඳ දේපල සොරකම් කිරීමක් සම්බන්ධ පැමිණිල්ලක් ලැබී ඇත. මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් වගඋත්තරකරුවන් විමර්ශනයක් ආරම්භ කර ඇති

අතර, ඊට අදාළ සාක්ෂි, මෙම පැමිණිලිකරුගේ ප්‍රකාශ, සටහන් කරගෙන ඇති බවත් නිරීක්ෂණය වේ. අනතුරුව බී 322/2016 යටතේ සැකකරු ගරු අධිකරණය වෙත ඉදිරිපත් කර ඇත.

අංක ඇ.ස.වා 6014/2016 දරණ ඇඟිලි සටහන් කාර්යාලයෙන් ඉදිරිපත් කර ඇති ඇඟිලි සටහන් වාර්තාවේ පිටපතක් කොමිෂන් සභාව වෙත ලබා දී ඇති අතර, එහි මෙම පැමිණිලිකාර සම්පත් වඩුගේ ඉදුනිල් චාමර සිල්වා යන අයගේ අතුල් සටහන් පතේ ඇති සටහනක් සමඟ සැසඳෙන බවට එම වාර්තාවේ දක්වා ඇත.

එසේම විමර්ශනයේදි අනාවරණය කර ගන්නා ලද තොරතුරු මත 2016.04.09 දින පැය 23.00ට පැමිණිලිකරුව අත්අඩංගුවට ගෙන ඇති බව නිරීක්ෂණය වන අතර, විමර්ශනයකින් පසු අත්අඩංගුවට ගත් බව අනාවරණය වේ.

පාර්ශව විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද සියලු තොරතුරු විමසා බැලීමේදි වගඋත්තකරුවන්ගේ ක්‍රියාවක් හේතුවෙන් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 13(1) සඳහන් නීතියෙන් නියම කරනු ලැබූ කාර්ය පටිපාටියට අනුකූලව මිස කිසිම තැනැත්තෙකු සිර භාරයට ගැනීම නොකල යුත්තේය යන මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී නොමැති බව නිරීක්ෂණය වේ.

මීලඟට වධහිංසාවට ලක්කළ බවට දක්වන කරුණු පිළිබඳ අවධානය යොමු කිරීමේදී, පැමිණිලිකරුව අත්අඩංගුවට ගැනීමෙන් පසුව උප පොලිස් පරීක්ෂක කාරියවසම් සහ පොලිස් කොස්තාපල් 46036 සුමිත් යන පොලිස් නිලධාරීන් විසින් තමාව අපරාධ අංශයේ කාමරයකට රැගෙන ගොස් ඇඳුම් ගලවා අත් පිටුපසට කර මාංචු දමා හෝස් බටයකින් පහරදුන් බව පරීක්ෂණයේදි ප්‍රකාශ කර ඇති අතර, පහරදීමෙන් පසු වතුර තිබහක් දැනුනු බවත්, වතුර ඉල්ලූ විට නම නොදන්නා නිලධාරියෙකු විසින් තමාගේ මූත්‍රා කුඩා භාජනයකට ගෙන තමන්ට බොන්න දුන් බවත් ප්‍රකාශ කර ඇත.

පැමිණිලිකරුට සිදුකරන ලදැයි පවසන පහරදීම් සම්බන්ධයෙන් අධිකරණ වෛද්‍ය නිලධාරි, පොළොන්නරුව වෙතින් අධිකරණ වෛද්‍ය වාර්තාව කැඳවා ඇත අතර, (2016.04.09 දින ඇප ලැබීමෙන් පසු) එම වෛද්‍ය වාර්ථාවට අනුව පැමිණිලිකරු 2016.04.11 වන දින ප්‍රතිකාර ලබා ගැනීම සඳහා රෝහල් ගත වී ඇත.

රෝගියා විසින් අධිකරණ වෛද්‍ය නිලධාරි වෙත රෝගී ඉතිහාසය ලෙස 2015.04.08 දින රාත්‍රී ඔහුගේ ඇඳුම් ගලවා අත් දෙක පිටුපසට කර මාංචු දමා අත්වලින් හා හෝස් බටයකින් පහරදුන් බව ප්‍රකාශ කර ඇත.

ඒ අනුව වෛද්‍යවරයාගේ වාර්තාවේ තුවාල යටතේ,

1. An Abrasion 4cmx3cm on back of the chest. (4cm × 3cm තරම් වූ සීරීම් තුවාලයක් පපුව පිටුපස)
2. An Abratedcontusion 10cmx1cm on inner aspect of the left wrist joint. (10cmx1cm පමණ වූ සීරීම් සහිත තැල්මක් වම් මැණික්කටුව යට පැත්තේ)
3. An abrasion 4cmx1cm on inner aspect of right wrist joint. (4cmx1cm සීරීමක් දකුණු මැණික් කටුව යට පැත්තට වන්නට)

පැමිණිලිකරුගේ අතෙහි වූ තුවාල අත්මාංචු හේතුවෙන් සිදුවූ තුවාල බවට වෛද්‍ය මතය සටහන් කර ඇත.

පැමිණිලිකරු විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද පැමිණිල්ල හා කොමිෂන් සභාව හමුවේ ලබාදී ඇති ප්‍රකාශ විමසා බැලීමේදී, ඔහුට අත්මාංචු දමා රාත්‍රී 8.30 සිට පසුදා අළුයම 4.30 තෙක් හෝස් බටයකින් පහරදුන් බව සඳහන් වේ. එමෙන්ම වෛද්‍යවරයා වෙතද දන්වා ඇත්තේ, පැමිණිලිකරුගේ පිටට හා මුත්‍රාශයට හෝස් බටයකින් පහරදුන් බවත්, අත්වලින් කම්මුල් දෙකට පහරදුන් බවත්ය.

පැමිණිලිකරු විසින් කොමිෂන් සභාව වෙත ලබා දී ඇති ප්‍රකාශ හා රෝගියා විසින් වෛද්‍යවරයා වෙත ලබාදී ඇති කෙටි ඉතිහාසය අනුව වගඋත්තරකරුවන් විසින් පැමිණිලිකරුගේ අත් දෙකට මාංචු දැමීම හේතුකොටගෙන පැමිණිලිකරුට තුවාල සිදුවී ඇති බව නිරීක්ෂණය වන අතර, පහරදීම් සිදුකළ ආකාරයත් තුවාලත් සැසඳෙන බව තහවුරු වේ.

ඒ අනුව සොරකමක් සම්බන්ධව අත්අඩංගුවට ගත් සැකකරුව වධහිංසාවට ලක්කර ඇති බව ඉහත කරුණු අනුව නිරික්ෂණය වේ. කිසිදු විටක අපරාධකරුවෙකු වවුද නොවූවද එම පුද්ගලයා වධහිංසාවට ලක් නොවිය යුතු බවට <u>අමල් සුදත් සිල්වා එදිරිව කොඩිතුවක්කු</u> (1987 2 SLR 119) නඩුවේදී පැහැදිලිව දක්වා ඇත.

එසේම වගඋත්තරකරුවන් විසින් පැමිණිලිකරුගේ අත්දෙකට මාංචු දමන ලද බව පිළිගෙන ඇති අතර, එය ප්‍රතික්ෂේප කර නොමැත.

දෙපාර්තමේන්තු නියෝග හි අත්මාංචු දැමීම සිදුකළ යුතු ආකාරය දක්වා ඇත. ඒ අනුව අංක 20 දරණ දෙපාර්තමේන්තු නියෝග (3) අනුව පොලිස් භාරයේ සිටින තැනැත්තන් පිළිබඳ දක්වා ඇති කොටසේ අත්මාංචු දැමීම එහි සිටින ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරියාගේ අභිමතය පරිදි කළ හැකි වන අතර, අත්අඩංගුවට ගෙන ඇති තැනැත්තා අස්ථානයේ අවමානයට භාජනය නොකොට ඔහු පැන යාම වැළැක්වීමට සෑම ආරක්ෂා විධිවිධානයක්ම සැලසිය යුතුය යනුවෙන් සඳහන් වේ. තවද පොලිස් නිලධාරියෙකු කිසියම් අවස්ථාවකදී සිරභාරයට ගෙන ඇති තැනැත්තෙකුගේ අත්මාංචු දමන විට එසේ කිරීමට හේතු දක්වා ස්වකීය සටහන් යොදන සටහන් පොතේ සටහන් යෙදිය යුතු බව දක්වා ඇති නමුත් එවැනි කටයුත්තක් සිදුවී නොමැති බව තවදුරටත් නිරික්ෂණය වේ.

නිගමනය :-

වගඋත්තරකරුවන්ගේ ක්‍රියාවන් හේතුවෙන් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 11 වන ව්‍යවස්ථාවෙහි සඳහන් "කිසිම තැනැත්තෙකු වධහිංසාවලට හෝ කෲර අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට නොහොත් දඬුවමකට යටත් නොවිය යුත්තේය" යන මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බව පරික්ෂණයෙන් අනතුරුව නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

1. පැමිණිලිකරුට පහරදීම සිදුකර ඇති පළවන හා දෙවන වගඋත්තරකරුවන් වන උ.පො.ප කාරියවසම් මහතා සහ පො.කො 46036 සුමිත් මහතා විසින් පැමිණිලිකරු වෙත රු. 5,000/- ක් (එක් අයකු 5,000 ක්) බැගින් වූ මුදලක් ගෙවිය යුතුය.

2. වගඋත්තර පාර්ශවයේ ඉහත ක්‍රියාකලාපය සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගැනීමට පොලිස්පති විසින් පියවර ගත යුතුය.

3. 1994 අංක 22 දරණ වධහිංසා පනත යටතේ වගඋත්තරකරුවන් සම්බන්ධයෙන් නඩු පැවරීමට අදාළ ක්‍රියාමාර්ග ගැනීම සඳහා පියවර ගැනීමටද පොලිස්පති, සහ නීතිපති විසින් පියවර ගත යුතුය.

2019.12.23 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

| | |
|---|---|
| රමණී මුත්තෙට්ටුවේගම, | එච්.ගසාලි හුසේන්, |
| කොමසාරිස්, | කොමසාරිස්, |
| ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව | ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව |
| Commissioner | Commissioner |
| Human Rights Commission of Sri Lanka | Human Rights Commission of Sri Lanka |
| No. 14, R.A. De Mel Mawatha, | No. 14, R.A. De Mel Mawatha, |
| Colombo 04. | Colombo 04. |

පිටපත :-

1. මූලස්ථාන පොලිස් පරීක්ෂක, පොලිස් ස්ථානය, පොළොන්නරුව. - ඉහත පළවන නිර්දේශය ක්‍රියාත්මක කර වාර්තා කිරීමට

2. පොලිස්පති, පොලිස් මූලස්ථානය, කොළඹ 01.

3. සභාපති, ජාතික පොලිස් කොමිෂන් සභාව, බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාව, කොළඹ 07.

4. නීතිපති, නීතිපති දෙපාර්තමේන්තුව, කොළඹ 12.

B/